# 11 ටිං ටිං ගාන්නා තෝරා එවන්නේ

තේරවිලි කියවා රසවිඳීමටත්, ඒවා විසඳීමටත් බොහෝ දෙනා කුඩා කල සිට කැමැත්තක් දක්වති. විවේකය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීමට හා විනෝදයට අතීතයේ දී තේරවිලි භාවිත කර ඇත. ඒවා පරිසරය පිළිබඳ දැනුම මෙන් ම භාෂා දැනුම වර්ධනය කර ගන්නට ද උදවු වෙයි.

තේරවිලි වර්ග කිහිපයක් තිබේ. සරල තේරවිලි, තුන් තේරවිලි, පද පෙරළි, තේරවිලි කවි වශයෙනි.



සරල තේරවිලි තෝරා පිළිතුරු සොයා ගැනීම පහසු ය. තේරවිල්ලට හොඳින් සවන් දී පිළිතුරු ලබා දීම මෙහි දී සිදු වේ. **නූල් බැඳි අහස් යානාව** යන්න සරල තේරවිල්ලකි.

මෙහි පිළිතුර කුමක් විය හැකි ද? අහස් යානාව ගුවනේ ගමන් කරයි. එයට නූල් බඳින්නේ නැත. එසේ නම් නූල් මගින් අහසේ පා කරන්නේ කුමක් ද? මේ කියන්නේ **සරුංගලය** ගැනයි.

තුන් තේරවිලි ද තවත් තේරවිලි වර්ගයකි. ඉදිරිපත් කරන තේරවිල්ල පියවර තුනක දී විසඳා අවසන් පිළිතුර ලබා ගැනීම මෙහි දී සිදු කෙරෙයි.

**ගොහොරු වෙල්ල** තුන් තේරවිල්ලකි. එය,

ගොහොරු නම් මඩ

වෙල්ල නම් **කණ්ඩිය**

මඩ කණ්ඩිය - **කඩ මණ්ඩිය** ලෙස පිළිතුර ලැබේ.



මේ සඳහා වචන පිළිබඳ දැනුමත් පද පෙරළීමේ කුසලතාවත් තිබිය යුතු ය.

**ගජනාළය** ද තුන් තේරවිල්ලකි.


ගජ නම් ඇත්

නාළය නම් බටය

ඇත් බටය - **බත් ඇටය**



පද හතරකින් යුත් තේරවිලි කවි තවත් තේරවිලි වර්ගයකි. ඒවා තාලයකට ගායනා කළ හැකි ය. එබඳු ඇතැම් තේරවිලි කවිවලට



පිළිතුරු කවි ද ඇත. පහත දැක්වෙන්නේ එබඳු තේරවිලි කවියකි.

**තේරවිලි කවිය**

ටිං ටිං ගාන්නා තෝරා　　　එවාපන්
ටං ටං ගාන්නා තෝරා　　　එවාපන්
මග වැලි පිසින්නා තෝරා　　　එවාපන්
දෙගම්බඩ රජා තෝරා　　　එවාපන්

**පිළිතුරු කවිය**

ටිං ටිං ගාන්නා ලේනා　　　නොවේ දෝ
ටං ටං ගාන්නා ගෝණා　　　නොවේ දෝ
මග වැලි පිසින්නා කුකුළා　　　නොවේ දෝ
දෙගම්බඩ රජා කිඹුලා　　　නොවේ දෝ

සතුන්ගේ හඬ, ගමන් කරන ආකාරය, හැසිරීම් රටා ආදිය පිළිබඳ අවබෝධය ඉහත තේරවිල්ලෙහි පිළිතුර සොයා ගැනීමට උපකාරි වෙයි.

මේ එවැනි තවත් තේරවිල්ලකි.

**තේරවිලි කවිය**

| | |
|---|---|
| ඉණේ තිබෙන ලිය තෝරා | එවාපන් |
| ගෙදර තිබෙන ලිය තෝරා | එවාපන් |
| ගසේ තිබෙන ලිය තෝරා | එවාපන් |
| අතු අග තිබෙන ලිය තෝරා | එවාපන් |

**පිළිතුරු කවිය**

| | | |
|---|---|---|
| ඉණේ තිබෙන ලිය හැඹිලිය | නොවේ | දෝ |
| ගෙදර තිබෙන ලිය ඇතිළිය | නොවේ | දෝ |
| ගසේ තිබෙන ලිය හෙරලිය | නොවේ | දෝ |
| අතු අග තිබෙන ලිය අරලිය | නොවේ | දෝ |

සිතීමේ හැකියාව දියුණු කර ගැනීමට තේරවිලි උපකාර වේ. අතීතයේ මෙන් ම වර්තමානයේ ද තේරවිලි නිර්මාණය වෙයි. ඔබටත් විනෝදජනක ක්‍රීඩාවක් ලෙස තේරවිලි ඉදිරිපත් කිරීම හා විසඳීම යොදා ගත හැකි ය. අලුත් තේරවිලි නිර්මාණය ද අපූරු අද්දැකීමක් වනු ඇත.

## අවබෝධය

1. පාඩම කියවා උත්තර දෙන්න.

   i. තේරවිලි වර්ග තුනක් නම් කරන්න.

   ii. පියවර තුනක දී විසඳා අවසන් පිළිතුර ලබා ගත හැකි තේරවිලි වර්ගය කුමක් ද?

2. නිවැරදිව යා කරන්න.

| | |
|---|---|
| ඉණේ තිබෙන ලිය | ඇතිළිය |
| ගෙදර තිබෙන ලිය | හැඹිලිය |
| ගසේ තිබෙන ලිය | අරලිය |
| අතු අග තිබෙන ලිය | හෙරලිය |

## ක්‍රියාකාරකම 1

**පහත දක්වා ඇත්තේ අලුතෙන් නිර්මාණය කරන ලද තේරවිලි කවියකි. එයට සුදුසු පිළිතුරු කවියක් නිර්මාණය කරන්න.**

ඉගෙනුම ලබන සල තෝරා    එවන්නේ
සිතුවම් අඳින සල තෝරා    එවන්නේ
අකුරු ලියන සල තෝරා    එවන්නේ
රජුන් විසූ සල තෝරා    එවන්නේ

## ක්‍රියාකාරකම 2

**කණ්ඩායම්වලට බෙදී තේරවිලි තරගයක් පවත්වන්න.**